---

**හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 ජූනි 10 වන දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 ජූලි 22 දින ද විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කිරීමේදී සභාව විසින් අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩු පාඩු

මූල්‍ය ප්‍රකාශනවල පැවති ගිණුම්කරණ අඩුපාඩු හා එමගින් මූල්‍ය ප්‍රකාශනවලට සිදු වී ඇති බලපෑම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | අඩුපාඩුවේ ස්වාභාවය | විෂයයන් ගණන | මූල්‍ය ප්‍රකාශනයන්ට බලපෑම | | | |
|---|---|---|---|---|---|---|
| | | | ආදායම් | වියදම් | වත්කම් | වගකීම් |
| | | | රු'000 | රු'000 | රු'000 | රු'000 |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම් | 01 | - | - | ගණනය කර නැත | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | - එම - | 08 | - | - | 1.414 | - |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් | 02 | 336 | - | - | - |
| (ඇ). | මූල්‍ය ප්‍රකාශනවල අනුචිත හෙළිදරව් කිරීම් | 01 | - | - | 124 | - |
| | - එම - | 01 | - | - | - | 217 |
| | | 01 | - | 34 | - | - |

**1.3.3 නොසැසඳු ගිණුම්**

ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.35,908,209 ක් වූ අතර, උපයෝගී ලේඛන හා වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.30,019,710 ක් විය.

**1.3.4 ගෙවිය යුතු ගිණුම්**

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 කාලයක් ඉක්මවා තිබුණු ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.106,788 ක් විය.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.129,600 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාපනය/සතොයක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.6 අනුකුල නොවීම**

පහත දැක්වෙන නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i). 163 | වර්ෂයේ ආදායම ගණනය කිරීම සඳහා සාරාංශ ආදායම් ලේඛණය (ප්‍රා.ස.19) සකස් කර නොතිබුණි. |
| (ii). 180 | ලේකම් වරයා විසින් ඇප තබා නොතිබුණි. |
| (ආ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i). මු.රෙ.104 | ප්‍රාදේශීය සභාවට අයත් අංක 252-6536 දරන කැබ්රථය අනතුරට පත්වී අලුත්වැඩියා කිරීම සඳහා රු.201,346 ක් වැය කර ඇති නමුත් ඊට අදාල ප්‍රාරම්භක හා පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii). මු.රෙ.756 | සමාලෝචිත වර්ෂය තුල ප්‍රාදේශීය සභාවේ භාණ්ඩ පිළිබඳව හර වැරදි බැලීම සඳහා සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (iii). මු.රෙ.1645(අ) | සභාවේ අංක 252 - 6536 කැබ් රථයේ අලුත්වැඩියාවන් සහ ටයර් මාරු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.767,809 ක් වැය කර තිබුණ අතර එම වියදම් ලොග් පොත්වල ඇතුලත් කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

| | |
|---|---|
| vii පරිච්ඡේදයේ 13.7 වගන්තිය | විධිමත් පත්වීමේ ලිපියක් නොමැතිව සභා ලේකම් වරයාට මාසිකව රු.4,287 බැගින් 2010 වර්ෂය සඳහා රු.51,450 ක් වැඩ බැලීමේ දීමනා ලෙස ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.71,186 ක්වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.777,041 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තු ගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තු ගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| (අ) | වරිපනම් හා බදු | 187 | 126 | 275 | 184 | 285 | 256 |
| (ආ) | කුලී මුදල් | 2,373 | 1,739 | 2,169 | 2,230 | 1,683 | 1,842 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 650 | 453 | 1,035 | 640 | 452 | 1,041 |
| (ඈ) | වෙනත් ආදායම් | 2,721 | 828 | 838 | 3,402 | 1,183 | 1,552 |

---

### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.251,732 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

### 2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.300,000 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.2.4 කඩකාමර කුලී

(I) සමාලෝචිත වර්ෂය සඳහා රු.460,800 කට බිල්කර තිබුණු කඩකාමර කුලී ආදායමින් රු.316,300 ක් අයකර ගෙන නොතිබුණු අතර, 2009 දෙසැම්බර් 31 දිනට පැවති රු.797,055 ක හිඟයෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි.

(II) සභාව සතු කඩ කාමර 21 ක් පවතින අතර ඉන් කඩ කාමර 13 කින් 2007 වර්ෂයේ සිට කිසිදු කුලියක් අය නොවන බව විගණනයේදී අනාවරණය විය. බදුදීමේදී විධිමත් ගිවිසුම් වලට එළඹ නොතිබීම මෙයට හේතු වී ඇති අතර මෙම කඩ කාමර නැවත බදු දීමට පියවර නොගැනීම හේතුවෙන් සභා අරමුදලට රු.990,955 ක පාඩුවක් සිදුවී තිබුණි.

### 2.2.5 වරිපනම්

වසර 17 කට පමණ පෙර පැවති තක්සේරුව මත ප්‍රාදේශීය සභාව විසින් වරිපනම් බදු අය කරමින් පැවති අතර දේපල වල සැලකිය යුතු වෙනස්කම් සිදුවී ඇතත් නැවත දේපල තක්සේරු කර වරිපනම් බදු පැනවීමට පියවර ගෙන නොතිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැය ගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' | රු. 000' |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පුද්ගල පඩි නඩි | 7,323 | 6,124 | 1,199 | 7,992 | 6,383 | 1,609 |
| අනෙකුත් | 3,880 | 3,061 | 819 | 4,209 | 1,445 | 2,764 |
| උප එකතුව | 11,203 | 9,185 | 2,018 | 12,201 | 7,828 | 4,373 |
| ප්‍රාග්ධන වියදම | 4,100 | 8,924 | (4,824) | 3,405 | 25,780 | (22,375) |
| මුළු එකතුව | 15,303 | 18,109 | (2,806) | 15,606 | 33,608 | (18,002) |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| | සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|---|
| (i) | මාණ්ඩලික | 01 | - |
| (ii) | ද්වීතියික | 04 | 07 |
| (iii) | ප්‍රාථමික | 10 | 14 |
| (iv) | වෙනත් (අනියම්/තාවකාලික) | - | 04 |
| | එකතුව | 15 | 25 |

===== ====

(ආ) සභාවේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 10 දෙනකු සේවයේ යොදවා ගෙන 2010 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය සඳහා රු.1,282,020 ක් සභා අරමුදලින් වැටුප් ලෙස ගෙවා තිබුණි.

2.5 වත්කම් කළමනාකරණය

2.5.1 නිශ්ක්‍රීය භෞතික සම්පත්

උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් සහල් පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා 2007 වර්ෂයේදී සභාවට රු.613,500 ක් වටිනා බේකරි නිෂ්පාදන උපකරණ ලබාදී තිබුණු අතර කර්මාන්තය ස්ථාපිත කිරීම සඳහා රු.327,000 ක අතිරේක වියදම් දරා තිබුණු නමුත් අදාල ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම නිසා එම සියලු වත්කම් නිශ්කාර්යව පැවතුණි.

2.5.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනානකම රු.35,777,510 ක් විය. අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු. 115,242 ක් විය.

2.5.3 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.824,481 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟ හිටි ගිණුම් ශේෂවල එකතුව රු.140,826 ක් විය.

2.5.4 අචල ජංගම වත්කම්.

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අවලව පවතින වත්කම්වල අගය රු. 83,385 ක් විය.

2.5.5 සමීක්ෂණය නොකළ වත්කම්

භෞතික පරීක්ෂණ/සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම් වල වටිනාකම රු. 9,153,474 ක් විය.

2.6 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ වියදම්

පහත සදහන් කරුණු නිරීක්ෂණය විය

(අ). වර්ෂයක කාලයක් තුලදී රු.1,000 ඉක්මවා දරන ලද ආධාර මුදල් සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.97,000 ක ආධාර සඳහා1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය අනුව සභාවට ලැබිය යුතු යම් මුදලක් අත්හැර දැමීම සඳහා සභා අනුමැතියට අමතරව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ අනුමැතිය ලබා නොගෙන රු.39,180 ක ආදායම් පොත් වලින් ඉවත් කර තිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සභාව විසින් 2009 වර්ෂයේදී රැස් කර ගන්නා ලද 5% රඳවා ගැනීමේ බදු මුදල් රු.32,689 ක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු නොකර ඉදිරියට ගෙන යමින් පැවතුණි.

2.8 කාර්ය සාධනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය ප්‍රකාර සභා බල ප්‍රදේශයේ ජනතාවගේ පහසුව, සුභ සාධනයට අදාල කාර්යයන් හා සෞඛ්‍ය, මංමාවත් හා පොදු

උපයෝගී සේවාවන්ට අදාල කාර්යයන් ඉටුකිරීම සඳහා ඉදිරි වර්ෂවල ක්‍රියාකාරීත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා එම සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඉටුකිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණි.

2.9 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ). ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:12:2 ජේදය ප්‍රකාරව ගොවි සංවිධාන සතුව කොන්ත්‍රාත් කිරීමේ හැකියාව පරීක්ෂා කළ පසු පමණක් කොන්ත්‍රාත් පිරිනැමිය යුතු වුවත් එසේ හැකියාව පරීක්ෂා කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 05 කදී රු.3,608,968 ක කොන්ත්‍රාත් ගොවි සංවිධාන වෙත පවරා තිබුණි.

(ආ). කර්මාන්ත ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට නිම නොකර ප්‍රමාද කර තිබූ අවස්ථා වලදී කාර්මික නිලධාරීගේ අනුමැතියකින් තොරව හා පිළිගත හැකි හේතු දැක්වීමකින් තොරව සභාපතිවරයාගේ අභිමතය පරිදි දින දීර්ඝ කිරීම නිසා කර්මාන්ත 05 ක් සඳහා කර්මාන්ත වලගෙවීම් වලින් අඩු කර ගත යුතු ප්‍රමාද ගාස්තු රු.27,000 ක් අඩු කර ගැනීමේ අවස්ථාව අහිමිව ගොස් තිබුණි.

2.10 අභ්‍යන්තර විගණනය

-----------------------

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) වත්කම් කළමණාකරණය